රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2015 (III)

මගේ අංකය : CS/SLAS/AMEN/MINUT(III වෙළුම)
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2016 ජුනි මස 14 වෙනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම</u>**

2012.07.01 දිනට පෙර සේවයේ ස්ථිර කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විෂයය සමත් වීම සම්බන්ධයෙන් අංක 4. හා 5. යටතේ කරුණු ඇතුලත් කරමින් 2015.04.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2015 හි, 02 ඡේදයෙහි අංක IV යටතේ වන සටහන පහත පරිදි සංශෝධනය කරමි.

**02.** **<u>කාර්යක්ෂමතා කඩඉම්</u>**

IV.

සටහන:

1. නව සේවා ව්‍යවස්ථාවේ දැක්වෙන අන්තර් කාලය තුළ සේවයේ ස්ථිර කරනු ලබන, 2014.12.31 දක්වා පූර්ව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පවත්වනු ලැබූ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යටතේ වන රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය විෂයය සමත් වී නොමැති නිලධාරීන්, නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පවත්වනු ලබන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යටතේ වන රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විෂයය, II වන ශ්‍රේණියට උසස් වීමට පෙර සමත් විය යුතුය.

2. එකී අන්තර් කාලය තුළ සේවයේ ස්ථිර නොවුන නිලධාරීන්, ඉන් පසුව සේවයේ ස්ථිර කිරීමට නම් නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පවත්වනු ලබන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යටතේ වන රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විෂයය සමත් වී තිබිය යුතුය.

3. **<u>ඉහත 2. හි නිලධාරීන් හට</u>** 2013.12.31 දින සිට පවත්වනු ලබන **<u>අනුගාමී</u>** විභාග වාර 04 කට පෙනී සිට රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විෂයය සමත් වීම සඳහා සහන කාලයක් ලබා දෙනු ලැබේ.

4. 2012.07.01 දිනට පෙර සේවයේ ස්ථිර කරන ලද, පූර්ව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පවත්වනු ලැබූ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යටතේ වූ රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය විෂයය මෙතෙක් සමත් වී නොමැති නිලධාරීන්, II වන ශ්‍රේණියට උසස් වීමට පෙර නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පවත්වනු ලබන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යටතේ වන මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විෂයය සම්පූර්ණ කළ යුතුය.

5. **<u>ඉහත 4. හි සඳහන් යම් නිලධාරියෙකුට</u>** මෙම තීරණය දැනුම් දීම මත මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විෂයයට පෙනී සිටීමට අවස්ථාව තිබියදී ඒ සඳහා අයදුම් නොකිරීම මත අවස්ථාව අහිමිවුවහොත්, මින් ඉදිරියේ දී පවත්වනු ලබන විභාග වාර 04 ක සහනයක් ලබා දෙන අතර එම වාර 04 තුළ සමත් නොවුනහොත් පමණක් වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ.

02. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිවය.

ජේ. දඩල්ලගේ
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.